*සැ. යු.* — 2012.05.25 දින පළ වූ අංක 1,760 දරන ගැසට් පත්‍රයේ I-III, III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,761 - 2012 ජුනි මස 01 වැනි සිකුරාදා - 2012.06.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | 968 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |



*සැ. යු.*- ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

*සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරි (සිවිල්)/කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂණ) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012*

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු* | *පුරප්පාඩු ගණන* |
|---|---|
| i. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය<br>ii. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) II 'ආ' බණ්ඩය | 20 |
| iii. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂණ) පුහුණු කිරීමේ ශ්‍රේණිය<br>iv. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂණ) II 'ආ' බණ්ඩය | 02 |

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව පදනම් කරගෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ට අදාළව දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් මෙම තනතුරු සඳහා පත්කිරීමට තෝරාගනු ලැබේ. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තිශ්චය කරනු ලැබේ. ඒ සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. දැනට පවතින පුරප්පාඩු හා ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ.

03. *බඳවා ගැනීමේ කොන්දේසි.-*

3.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

3.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

3.3 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 06 තුළ අනුගාමී වසර 03 ක් සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.

3.4 රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් මෙම තනතුරු සඳහා අයදුම් කරන්නේ නම් ඔවුන් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට කිසිදු විනය දඬුවමක් ලබා නොමැති එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති සතුටුදායක සේවා කාලයක් සහිත අය විය යුතු ය.

04. *වයස් සීමාව.-* ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් අයදුම්කරුවන් වූ විටක ඔවුන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්.-*

5.1 අධ්‍යාපන සුදුසුකම්.-

5.1.1 කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය

(අ) *මූලික අධ්‍යාපන සුදුසුකම්.-*

භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම සහ පැරණි නිර්දේශය අනුව ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් 03කින් සමත්වීම හෝ නව නිර්දේශය අනුව භෞතික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.

*හා*

(ආ) ජාතික තාක්ෂණික (සිවිල්) සහතිකය ලබා තිබීම හෝ ඊට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

5.1.2 ප්‍රමාණ සමීක්ෂණ පුහුණු කිරීමේ ශ්‍රේණිය

(අ) *මූලික අධ්‍යාපන සුදුසුකම්.-*

භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම සහ පැරණි නිර්දේශය අනුව ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයන් 03 කින් සමත්වීම හෝ නව නිර්දේශයට අනුව සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම

*හා*

*(ආ)* ජාතික තාක්ෂණික (ප්‍රමාණ සමීක්ෂණ) සහතිකය ලබා තිබීම හෝ ඊට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම්.-

5.2.1 කාර්මික නිලධාරි (සිවිල්) II 'ආ' බණ්ඩය.-

ඉහත 5.1.1 (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය.

i. මොරටුව විශ්වවිද්‍යාලය/අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (සිවිල්) ඩිප්ලෝමාව ලබා තිබීම ; හෝ

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ; හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ; හෝ

iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ; හෝ

v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වැනි කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම ; හෝ

vi. ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

*සටහන*.- ඉහත 5.2.1 හි I සිට VI දක්වා වූ තාක්ෂණික සුදුසුකම් සපුරා ඇති අය එම පාඨමාලා හැදෑරීමට බඳවා ගන්නා අවස්ථාවේ එම පාඨමාලාවන්ට ඇතුළත් වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

5.2.2 ප්‍රමාණ සමීක්ෂණ II 'ආ' බණ්ඩය.-

ඉහත 5.1.2 (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය.

i. මොරටුව විශ්ව විද්‍යාලය/ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (සිවිල්) ඩිප්ලෝමාව ලබා තිබීම ; හෝ

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (ප්‍රමාණ සමීක්ෂණ විෂය ඇතුළත් විය යුතු ය.) ; හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (ප්‍රමාණ සමීක්ෂණ විෂය ඇතුළත් විය යුතු ය.) ; හෝ

iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (ප්‍රමාණ සමීක්ෂණ විෂය ඇතුළත් විය යුතු ය.) ; හෝ

v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම. (ප්‍රමාණ සමීක්ෂණ විෂය ඇතුළත් විය යුතු ය.) ; හෝ

vi. ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

*සටහන*.- ඉහත 5.2.2 හි I සිට VI දක්වා වූ තාක්ෂණික සුදුසුකම් සපුරා ඇති අය එම පාඨමාලා හැදෑරීමට බඳවා ගන්නා අවස්ථාවේ එම පාඨමාලාවන්ට ඇතුළත් වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

06. වැටුප් පරිමාණ :- (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) අනුව) කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය

රු.13,120 - 145 x 10 - 170 x 11 - 240 x 10 -320 x 10 -22,040 (MN-1-2006 A)
කාර්මික නිලධාරි (සිවිල්) පන්තිය 'ආ' බණ්ඩය

රු.15,005 - 180 x 4 -240 x 6 - 320 x 11 - 360 x 20 -27,885 (MN-3 - 2006 A)

07. *සේවා කොන්දේසි*.-

1. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

2. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ තනතුරු පාලනය වේ. එම සේවා ව්‍යවස්ථාවට හා ඊට කලින් කළ කරනු ලැබිය හැකි සංශෝධනවලට ද පත්වීම් ලබන්නන් යටත් වේ.

3. කාර්මික නිලධාරි (සිවිල්)/ප්‍රමාණ සමීක්ෂණ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන්නන් අදාළ විෂය නිර්දේශය අනුව ලබාගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකර පුහුණු කාලය අවසානයේ පවත්වන විභාගය සමත්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණිය වන II වැනි පන්තියේ 'ආ' බණ්ඩයට පත් කෙරේ. පුහුණුව අවසානයේ දී පවත්වනු ලබන විභාගයෙන් සමත් වන්නාවූ හා පුහුණු කාලය තුළ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකව තිබෙන්නා වූ පුහුණු වන්නන් පුහුණුව සාර්ථකව නිම කරන ලද අය සේ සැලකේ. පුහුණුව සාර්ථකව අවසන් නොකරන ලද අය පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත.

4. II පන්තිය 'ආ' බණ්ඩයට පත්වීමෙන් පසු වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය.

08. *විභාග ක්‍රමය*.-

1. මෙම තරග විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් රත්නපුර හා කෑගල්ල යන නගරවල දී පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

2. එක් එක් තනතුරු සඳහා වූ තරග විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. ලිඛිත විභාගයෙන් සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතු ය. එක් ප්‍රශ්න පත්‍රයකට ලැබෙන ලකුණු ප්‍රමාණය 100 කි.

අභියෝග්‍යතාව - කාලය පැය 01 යි.

මෙම ප්‍රශ්න පත්‍රය සංඛ්‍යාමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කෙරෙන විෂයානුබද්ධ කෙටි ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත.

සාමාන්‍ය දැනීම - කාලය පැය 1 1/2 කි.

මෙම ප්‍රශ්න පත්‍රය පරිසර, විද්‍යාත්මක සොයාගැනීම්, විද්‍යා දැනුම හා ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න වලින් යුක්තය.

09. විභාග ගාස්තුව රු. 450 කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 2003-09-01 දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ. තරග විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණ වල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ. ඉහළම කුසලතාවයක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුසු අයෙකු ලෙස සලකනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

11. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-*

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

12. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු.20,030 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ සිටිය යුතු ය.

13. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ - 4 වැනි ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින්,

i. අනු අක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවැනි පිටුවටද අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතු ය.

ii. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2012.06.29 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභාකාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

iii. එම ඉල්ලුම්පත්‍රයේ ඡායාපිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති ඉල්ලුම්පත්‍ර හා ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

iv. විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර, සේවා ස්ථානය සහ ලිපිනය විභාගය හා සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

14. විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් දන්වනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් විභාගය සඳහා ඉල්ලුම් නොකළහොත් එම අයදුම්කරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ප්‍රවේශ පත්‍ර තැපැල් කෙරෙනු ඇත. එසේ නොවුනහොත් අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර සාමාන්‍ය තැපෑලෙන් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 02 හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

15. ලිඛිත විභාගයේ දී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

16. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

17. විභාගය ආරම්භ වන දිනයේ, විභාග ශාලාධිපති වෙත, තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

18. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

සුනේත්‍රා ගුණවර්ධන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්)/ කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂණ) තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2012**

Open Compititive Examination For Recruitment to Posts in the Technical Service of the Sabaragamuwa Provincial Public Service ~ Technical Officer (Civil) Technical Officer (Quantity Serveyer) - 2012

විභාගය අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන
නගරය හා නගර අංකය :

රත්නපුර - 1
කෑගල්ල - 2

| නගරය | නගර අංකය |
|---|---|
| | |

(ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :-PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

2.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.5 දුරකථන අංකය :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 2
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

3.3 2012.06.29 දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

4.0 අධ්‍යාපන සුදුසුකම් : :————.

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය :————.
ii. විභාග අංකය :————.
iii. ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 *තාක්ෂණ සුදුසුකම් :-*

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :————.

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :————.
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

8.1 දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ලිපිනය :————.
8.2 දැනට දරන තනතුර :————.
8.3 සේවා කාලය :————.
8.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :————.

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපතේ අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

*ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.*
*(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

10.0 *අයදුම්කරුගේ සහතිකය.-*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන සියලු නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

11.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත නම් සඳහන් සහතිකය ද දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් කළ යුතු ය.

(1) මෙම දෙපාර්තමේන්තුවේ.................................... දින සිට................................. තනතුරේ සේවය කරන මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත් අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(2) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරාගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තුවේ/ආයතනයේ
ප්‍රධානියාගේ හෝ බලය පවරනු
ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :————.

පදවියේ නම :————.

දිනය :————.

දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (කරුණාකර නිල මුද්‍රාව තබන්න)

06-146

---

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

*සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III පන්තියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012*

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III පන්තියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පවතින පුරප්පාඩු ප්‍රමාණය 39 කි. බඳවා ගන්නා අවස්ථාවේ දී මෙම සංඛ්‍යාව අඩු හෝ වැඩි වීමට ඉඩ තිබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල අනුව කුසලතාව පදනම් කරගෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ට අදාළව දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් මෙම තනතුරු සඳහා පත්කිරීමට තෝරාගනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. ඒ සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

03. *වැටුප් පරිමාණය.-*

රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885/- (රා. පරි. චක්‍රලේඛ 6/2006 (iv) හා 7/2008 අනුව එම්එන් 3 - 2006 ඒ)

04. *බඳවා ගැනීමේ කොන්දේසි.-*

4.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

4.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 06 තුළ අනුගාමී වසර 03 ක් සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.

4.4 රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් මෙම තනතුරු සඳහා අයදුම් කරන්නේ නම් ඔවුන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට කිසිදු විනය දඬුවමක් ලබා නොමැති එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති සතුටුදායක සේවා කාලයක් සහිත අය විය යුතු ය.

05. *වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් අයදුම්කරුවන් වූ විටක ඔවුන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්.-*

6.1 *අධ්‍යාපන සුදුසුකම් :*

භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරකදී සමත්වීම සහ ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 03කින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.

*හා*

6.2 කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව පහත සඳහන් සහතිකයක් ලබා තිබීම.

(i). කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන කෘෂිකර්ම විද්‍යාලය මගින් නිකුත් කරන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය

*හෝ*

(ii). හාඩි කාර්මික විද්‍යාලයෙන් නිකුත් කරනු ලබන කෘෂිකර්ම විද්‍යාව සම්බන්ධ ඩිප්ලෝමා සහතිකය

*හෝ*

(iii). ඇක්වයිනස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය

*හෝ*

(iv). උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණික විද්‍යාලය මගින් පිරිනමන කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය

*හෝ*

(v). සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබිය හැකි කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ඉහත සුදුසුකම්වලට සමාන සුදුසුකමක් ලබා තිබීම.

07. *සේවා කොන්දේසි.-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ මෙම තනතුර පාලනය වේ. එම සේවා ව්‍යවස්ථාවට හා ඊට කලින් කල කරනු ලැබිය හැකි සංශෝධනවලට ද පත්වීම් ලබන්නන් යටත් වේ.
3. III පන්තියට සමත්වීමෙන් පසු වසර 03ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය.

08. *විභාග ක්‍රමය.-*

1. මෙම තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

2. විභාගය රත්නපුර හා කෑගල්ල නගර තුළ පමණක් පැවැත්වේ. එම නගර අංක පහත සඳහන් වේ. තමා විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය ඒ අනුව අදාළ අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු ය. විභාගයට පෙනී සිටීමට අයදුම් කල නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| රත්නපුර | 19 |
| කෑගල්ල | 20 |

3. තරග විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. ලිඛිත විභාගයෙන් සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතු ය. එක් ප්‍රශ්න පත්‍රයකට ලැබෙන ලකුණු ප්‍රමාණය 100 කි.

බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි - ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතයි.

තාක්ෂණ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 2 කි - ලකුණු 100 යි.

මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට අදාළ දැනුම පරීක්ෂා කිරීම සඳහා වන පහත දැක්වෙන ක්ෂේත්‍ර සියල්ලටම හෝ ක්ෂේත්‍ර කිහිපයක් හෝ අදාළ කරගනිමින් සකස් කර ඇති කෙටි පිළිතුරු හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.) :-

1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය ;
2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම ;
3. පස හා ශාඛ පෝෂණය ;
4. වී, පළතුරු, එළවළු, වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය ;
5. භෝග ආරක්ෂණය ;
6. පාංශු සංරක්ෂණය, වාරිමාර්ග හා ජල කළමනාකරණය ;
7. ගොවිපල් යාන්ත්‍රීකරණය, මී මැසි පාලනය, මල් වගාව හා භූමි අලංකරණය ;
8. කුකුළු නිෂ්පාදනය හා කිරිගව කර්මාන්තයේ වැදගත්කම ;
9. කෘෂිකාර්මික ව්‍යාප්තිය, පටක රෝපණය, පැලෑටි නිරෝධායනය, ශාඛ සංරක්ෂණය ;
10. ජාන තාක්ෂණය, කෘෂිකර්ම සංවර්ධනය.

09. විභාග ගාස්තුව රු. 450 කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 2003-90-01 දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙසට සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයගේ අයදුම්පත්‍ර පමණක් භාරගනු ලබන අතර නිවේදනයට අනුව සුදුසුකම් නොමැති අනෙකුත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% කට හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ. ඉහළම කුසලතාවයක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුසු අයෙකු ලෙස සලකනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

11. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයැදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

12. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-*

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

13. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රා. පරි. චක්‍රලේඛ 06/2006 අනුව රු.20,030 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

14. *අයදුම් කළ යුතු පිළිවෙල.-*

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ - 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනය ගනිමින්,

(i) අනු අක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවැනි පිටුවට ද අංක 04 සිට 09 තෙක් දෙවැනි පිටුවට ද ඉතිරිය තුන්වැනි පිටුවට ද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතු ය. නිසි පරිදි සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) එම අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති අයදුම්පත්‍ර, නිවේදනයේ සුදුසුකම්වලට අදාළ නොවන අයදුම්පත්‍ර හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

(iii) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2012.06.29 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III පන්තියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012" යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

15. විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් දන්වනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් විභාගය සඳහා ඉල්ලුම් නොකළහොත් එම අයදුම්කරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ප්‍රවේශ පත්‍ර තැපැල් කෙරෙනු ඇත. එසේ නොවුනහොත් අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර සාමාන්‍ය තැපෑලෙන් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. විභාගය සම්බන්ධයෙන් අපේක්ෂකයන් 1968 අංක 25 දරන විභාග පනතෙහි විධිවිධානයන්ට යටත් විය යුතු අතර, අපේක්ෂකයන් සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

16. ලිඛිත විභාගයේ දී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

17. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

18. විභාගය ආරම්භ වන දිනයේ, විභාග ශාලාධිපති වෙත, තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

19. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

සුනේත්‍රා ගුණවර්ධන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
නවනගරය, රත්නපුරය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III පන්තියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012***

Open Compititive Examination For Recruitment to Posts in the Sri Lanka Technical Service of the Sabaragamuwa Provincial Public Service Agriculture Instructor Quantity Serveyer - 2012

විභාග අංකය : ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව :- 06

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය :

රත්නපුර - 19
කෑගල්ල - 20

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| | |

(ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :-PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

1.5 දුරකථන අංකය (තිබේනම්) ☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.

2.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 2 ☐

(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2012.06.29 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 ජන වර්ගය :- (අදාල අංකය කොටුව තුළ ලියන්න.)
(සිංහල - 1, දෙමළ - 2,
ඉන්දියානු දෙමළ - 3,
මුස්ලිම් - 4, වෙනත් - 5) ☐

4.0 *අධ්‍යාපන සුදුසුකම්.-*

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 *තාක්ෂණ සුදුසුකම්.-*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :—————

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | |
|---|---|

| නැත | |
|---|---|

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

8.1 දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ලිපිනය :—————.
8.2 දැනට දරන තනතුර :—————.
8.3 සේවා කාලය :—————.
8.4 ස්ථිර, විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :————.

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ෘ

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
(ii) ලදුපතේ අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

10.0 *අයදුම්කරුගේ සහතිකය.-*

(*අ*) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(*ඇ*) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන සියලු නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :—————.

—————,
අයදුම්කරුගේ අත්සන.

11.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ෘ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අදාල ස්ථානයේ අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත නම් සඳහන් සහතිකය ද දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් කළ යුතු ය.

(1) මෙම දෙපාර්තමේන්තුවේ.................................... දින සිට.................................. තනතුරේ සේවය කරන මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත් අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(2) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරාගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තුව/ආයතන
ප්‍රධානියාගේ හෝ බලය පවරනු
ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

06-181

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2012**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජුනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2012.07.06 | සිකුරාදා | 2012.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.13 | සිකුරාදා | 2012.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.20 | සිකුරාදා | 2012.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.27 | සිකුරාදා | 2012.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.